පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 9

විෂය- චිත්‍ර

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province

සාංචි ස්තූපය



- ඉන්දීය ගෘහ නිර්මාණ අතර අශෝක අධිරාජයා විසින් ඉදි කල සාංචි ස්තූපය ඉතා විශිෂ්ට නිර්මාණයකි.
- බුබ්බුලාකාර හැඩයකින් යුත් චෛත්‍යයකි.
- මෙය අඩි 120 ක විශ්කම්භයකින් හා අඩි 54ක උසකින් යුක්තය.
- පොළව මට්ටමේ සිට අඩි 16 ක් උසින් චෛත්‍ය වටා යා හැකි ප්‍රදක්ෂිනා පථයක් වේ. මෙම කොටස මේධිය නමින් හැදින්වේ.
- මේධිය මත ගර්භය පිහිටා ඇත.
- ස්තූපය මුදුන ශෛලමය ගරාදි වැටකින් යුත් හතරැස් කොටුවකි.මෙය හර්මිකාව ලෙස හැදින්වේ.
- හර්මිකාව මැද (ස්තූපය මුදුනේ ) මුදුන උල් වූ අටපට්ටම් සෙල්මුවා වැටක් ඇත. එය යූපය (යෂ්ටිය) ලෙස හඳුන්වයි.
- යූපය මුදුනේ වෘත්තාකාර පැතලි ගල් පුවරු තුනකි. මේවා පහළ සිට ඉහලට කුඩාවන ලෙස සකසා ඇත. මෙය ඡත්‍ර ලෙස හැදින්වේ.

සාංචී තොරණ



- සාංචි ස්තූපයේ සතර පැත්තේ තොරණ් 4ක් ඉදිකර ඇත.
- සාංචි තොරණ සාතවාහන  යුගයට අයත්ය.
- සාංචි තොරණ 4 මඑකම ආකෘකියට අනුව ඉදිකර ඇත.
- මෙම තොරන් දෙපසින් ඉදි වූ හතරැස් ගල් කුළුණු දෙකක් මත හරහට දිවෙන විශාල ගල් පුවරු හෙවත් උඩලිපත් තුනකින් සමන්විතය. මෙම උඩලිපත් අතර කැටයම් කළ ගරාදි තුනක් ඉදිකර ඇත.
- මෙම සෑම තිරස් සිරස් ගල් කණුවක්ම සාංචි ශිල්පියා කැටයමින් අලංකාර කර ඇත.
- ප්‍රධාන සිරස් කුළුණු අග ඇත් රූ , වාමන රූප , සිංහ රූපවලින් යුතු ශීර්ෂයකින් සමන්විත වන අතර එහි පළමු තිරස් අතට ඇති ගල් පතුරට කුඤ්ඤයක් ලෙස සම්බන්ධ වූ සාලබංජිකා නම් ස්ත්‍රී රූ මූර්තිමත් කර ඇත.
- තොරණ ඉහළින්ම ඇති තිරස් ගල් පුවරුව හෙවත් උඩලිපත මත ත්‍රිශූලය, මිනිස් රූප, සහ සත්ව රූප නිර්මාණය කර ඇත.

**සාංචි තොරණේ කැටයම් නිර්මාණවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ**

- සිරස් ගල් කුළුණු මත කැටයම් පනේල වශයෙන් දැක්වීම හා තිරස් ගල් පුවරු මත බොහෝ විට අඛණ්ඩ කථන ක්‍රමය අනුව කැටයම් නිර්මානය කර තිබීම.
- කැටයම් ඉතා සියුම් ලෙස අල්ප උන්නතව මතු කොට තිබීම.
- රූපයකට රූපයක් මුවා වන සේ රූප තලය මත සංරචනය කිරීම.
- ඉතා කුඩා ඉඩක් ඇති ස්ථාන පවා මානව රූප,සත්ව රූප, හා ශාක හැඩ අවකාශය පුරා සම්පින්ඩනය කිරීම.
- මිනිස් රූප ශෛලිගත ස්වරූපයෙන් කැටහම් කර ඇති අතර සත්ව රූප ඉතා ස්වභාවික ලක්ෂණයන්ගෙන් යුතුව දැක්වීම.
- සතුන්ගේ ඉරියව් ගති ලක්ෂණ හා චලනයන් තාත්විකව නිරූපනය කර දැක්වීම.
- බුදුරජාණන් වහන්සේ සහ සිදුහත් කුමරු දැක්වීම සඳහා බෝ ගස,

  ඡත්‍රය, ස්තූපය,ධර්ම චක්‍රය, සහ ශ්‍රීපාද ලාංඡනය වැනි සංකේත යොදා ගනු ලැබීම.

**ඡද්දන්ත ජාතකය**




- තිරස් ගල් පුවරු මත අඛණ්ඩ කථන ක්‍රමය අනුව නිර්මාණය කර ඇත.
- ඇතුන්ගේ ඉරියව්, ගති ලක්ෂණ හා ජලයන් තාත්වි‍කව නිරූපණය කර ඇත.
- ඉතා කුඩා අවකාශයක පවා කැටයම් කර ඇත.
- අල්ප උන්නතව නෙළා ඇති මෙම කැටයම මටසිලුටු නිමාවකින් යුක්තය.

**බුදුරජාණන්වහන්සේ සංකස්ස පුරයට වැඩම කිරීම**



- උතුරු තොරණේ ඉදිරිපස දක්නට ලැබේ.

- බුදුරජාණන්වහන්සේගේ රූපකාය වෙනුවට බෝ ගස සංකේතයට යොදා ඇත.
- අල්ප උන්නතව නෙළා ඇත.
- මටසිලුටු නිමාවකින් යුක්තය.

නැගෙනහිර තොරණේ මැද පුවරුවේ දක්නට ලැබෙන මහභිනික්ම කැටයෙමහි අසුපිට ඇත්තේ ඡත්‍රයකි. කේෂ ජේදනයෙන් පසු පැවදි වූ අවස්ථාව දක්වා ඇත්තේ සිරිපතුල් යුවලකිනි.

**වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

භාරතයේ සාංචි තොරණ කැටයම් කළ ශිල්පියා,

1. බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සැමවිටම යොදා ගත්තේ බෝධියයි
2. තේමාවන් සඳහා බුදුසිරිතේ සිද්ධි පමණක් යොදා ගෙන ඇත.
3. බුදුරජාණන්වහස්සේ වෙනුවට සංකේත භාවිත කොට ඇත.
4. සිද්ධි නිරූපනයේදී කැටයම් යොදාගෙන ඇත්තේ උඩලිපත්වල (හරස් පුවරුවල) පමණය.

**නිවැරදි පිළිතුරු ලියන්න.**

- සාංචි තොරණ ඉදිවූයේ කිනම් යුගයකදීද?
- භාරතයේ කදුගැටයක්මත ..............................විසින් ඉදිකරවන ලද සාංචි ස්තූප සංකීර්ණය බෞද්ධ කලා නිර්මාණ අතර වැදගත් ස්ථානයක් ගනී
- සාංචි තොරණේ මහභිනික්මන කැටයම අවසානයේ ..........................යෙදීමෙන් සිදුහත් කුමරු පැවිදි වූ බව සංකේතවත් කෙරේ.

**අර්ථය පැහැදිලිවන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

1. මේධි
2. උඩලිපත්
3. හර්මිකාව
4. සාලබංජිකා
5. යූපය